# “සාරි පොටේ” එල්ලීමෙන් නිමාවට පත් වූ ජනතා විමුක්ති පෙරමුණේ සමාජවාදී අරගලය

1983 ජුනි මාසයේ දී ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ධුරය ඇතුළු එහි සියළු වගකීම් වලින් ද, ගාල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධන සභා මන්ත්‍රී ධුරයෙන් ද ඉල්ලා අස් වෙන්නට තීරණය කිරීම සඳහා මට බල පෑ ප්‍රධාන මතවාදීමය සහ ප්‍රායෝගික වෙනස්කම් ගැන කරුණු කිහිපයක් මෙම ලිපියෙන් ඉදිරිපත් කරන්නට මම බලාපොරොත්තු වෙමි.

1971 අප්‍රේල් අරගලය පිළිබඳ තීරණයේ වගකීම සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය තුල පැහැදිලිව දක්නට




Ginipupura

තිබුනු දෙපිටකාට්ටු ස්වභාවය මගේ සිත තුල බල පැවැත්වූ සහ නොවිසඳී පැවතුනු එක කරුණක් විය. එද පැවතුන රාජ්‍ය මර්දනකාරී තත්වය යටතේ, එම අරගලයට පෙර අප කර ගෙන ගිය දේශපාලනයේ ඊළඟ ආසන්න ක්‍රියාමාර්ගය සහ තර්කානුකූල ප්‍රතිඵලය විය යුතුව තිබුනේ එම අරගලය දියත් කිරීමට තීරණය කිරීම පමණක්ය යන්න මා දැරූ මතය විය. එහෙත් රෝහණ සහෝදරයා මෙම මතය මුළුමණින් ප්‍රතික්ෂේප කරමින් කියා සිටියේ එම තීරණය සිය දිවි නසා ගැනීමට ගන්නා ලද එකක් බවයි. එහෙත් එවැනි තීරණයක් වැලැක්විය හැකිව තිබුනේ කෙසේදැයි යන්න ගැන කරුණු ඉදිරිපත් කිරීමක් හෝ 1971 අප්‍රේල් අරගලය පිළිබඳව (කෙටි ස්වයං විවේචනයක් හැර) සවිස්තරාත්මක ස්වයං විවේචනයක් හෝ ජනතා විමුක්ති පෙරමුණෙන් වත්, රෝහණ සහෝදරයා ගෙන් වත් ඉදිරිපත් කෙරුනේ නැත. එම අරගලයේ දී මතු වී තිබුන තත්වයන් ගැන මා අත් දුටු සහ දැන සිටි ඇතැම් වැරදි සහ අඩුපාඩු උපයෝගී කර ගනිමින් ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභාවේ දී ගන්නා ලද තීරණයක් අනුව මා විසින් සකස් කරන ලද සවිස්තරාත්මක ස්වයං විවේචනය මධ්‍යම කාරක සභාව තුල සාකච්ඡාවට භාජනය කරන ලදී.

රෝහණ සහෝදරයා ද ඇතුළු ඇතැම් මධ්‍යම කාරක සභිකයන් විසින් එහි පෙන්වා දී තිබුනු සමහර වැරදි සහ අඩුපාඩු පිළි නොග න්නා ලද අතර එවැනි වැරදි සහ අඩුපාඩු සිදු වූ බවක් ජනතා විමුක්ති පෙරමුණ පිළි නොගත යුතු බවත් ඒ අනුව මා විසින් සකස් කරන ලද සවිස්තරාත්මක ස්වයං විවේචනය උපයෝගී කර ගනිමින් අළුතෙන් ස්වයං විවේචනයක් සකස් කල යුතු බවත් තීරණය කරන ලදී. එම නව ස්වයං විවේචනය සකස් කිරීමේ වගකීම එවකට ජනතා විමුක්ති පෙරමුණේ අධ්‍යාපන ලේකම් වරයා ව සිටි දේශපාලන මණ්ඩල සභික දයා වන්නිආරච්චි සහෝදරයා වෙත පවරන ලදී. නව ස්වයං විවේචනය ඊළඟ මධ්‍යම කාරක සභාවේ සැසි වාරය වෙත ඉදිරිපත් කරන්නට දයා වන්නිආරච්චි සහෝදරයා එකඟ විය. එහෙත් ඊට පසු පැවැත්වූ මධ්‍යම කාරක සභාවේ න්‍යාය පත්‍රයට අනුව ස්වයං විවේචනය ගැන සාකච්ඡාව ආරම්භ කල විට දයා වන්නිආරච්චි සහෝදරයා පවසා සිටියේ මා විසින් සකස් කරන ලද සවිස්තරාත්මක ස්වයං විවේචනයේ අත් පිටපත ඔහු අතින් නැති වූ බවත්, ඒ අනුව නව ස්වයං විවේචනයක් සකස් කරන්නට නොහැකි වූ බවත්, ඔහුට ඉඩකඩ ලැබෙන ආකාරයට නව ස්වයං විවේචනයක් සකස් කොට මධ්‍යම කාරක සභාවේ සැසි වාරයකදී ඉදිරිපත් කරන බවත් ය.




**_1971 අප්‍රේල් අරගලය පිළිබඳ තීරණයේ වගකීම සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය තුල පැහැදිලිව දක්නට තිබුනු දෙපිටකාට්ටු ස්වභාවය මගේ සිත තුල බල පැවැත්වූ සහ නොවිසඳී පැවතුනු එක කරුණක් විය. එද පැවතුන රාජ්‍ය මර්දනකාරී තත්වය යටතේ, එම අරගලයට පෙර අප කර ගෙන ගිය දේශපාලනයේ ඊළඟ ආසන්න ක්‍රියාමාර්ගය සහ තර්කානුකූල ප්‍රතිඵලය විය යුතුව තිබුනේ එම අරගලය දියත් කිරීමට තීරණය කිරීම පමණක්ය යන්න මා දැරූ මතය විය. එහෙත් රෝහණ සහෝදරයා මෙම මතය මුළුමණින් ප්‍රතික්ෂේප කරමින් කියා සිටියේ එම තීරණය සිය දිවි නසා ගැනීමට ගන්නා ලද එකක් බවයි._**

එහෙත්, මට මතක අන්දමට, 1981 දී පමණ දයා වන්නිආරච්චි සහෝදරයා සම්බන්ධයෙන් පැන නැඟුන ප්‍රශ්ණ කිහිපයක් මත ඔහු පක්ෂයේ සියළු වගකීම් වලින් ඉවත් කරන ලද අවස්ථාව වන විටත් එවැන්නක් ඉදිරිපත් කෙරුනේ නැත. පක්ෂයේ ප්‍රධාන ලේකම් වරයා වශයෙන් 1982 සහ 1983 කාලයේ මට පැවරී තිබුන අධික වැඩ කටයුතු හමුවේ මේ සම්බන්ධයෙන් මගේ අවධානයද යොමු වූයේ නැත. පසු කාලයේදී ස්වයං විවේචනය සම්බන්ධයෙන් සොයා නොබැලීම ගැන මගේ වගකීමෙන් මටද නිදහස් විය නොහැකිය. 1983 ජූලි මාසයේ දී ජනතා විමුක්ති පෙරමුණෙන් ඉවත් වන්නට තීරණය කරන කාලය වන විට මා විසින් මුලින් සකස් කරන ලද සවිස්තරාත්මක ස්වයං විවේචනයේ පෙන්වා දී තිබුනු වැරදි සහ අඩුපාඩු පක්ෂය තුල තව තවත් ඔඩු දුව ගොස් තිබුණි.

මා ඉල්ලා අස් වූ අවස්ථාවේ දී ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ලිපියේ සඳහන් කර තිබුණු මූලික කරුණු කිහිපයක් මෙහිදී සාරාංශ ලෙසකින් ඉදිරිපත් කිරීමට උත්සාහ කරන්නෙමි.

- විප්ලවවාදී වැඩ ශෛලිය වෙනුවට හැඟීම් දනවන ආකාරයේ වැඩ ශෛලියක් අනුගමනය කිරීම, කම්කරු ජන කොටස් අතර කල යුතුව තිබුන පක්ෂ වැඩ කටයුතු වලට මුල් තැනක් නොදීම සහ අධ්‍යාපන වැඩ පිළිවෙලේ දුර්වල කම
- කම්කරු ජන කොටස් අතර කරන ලද වැඩ කටයුතු වෘත්තීය සමිති වාදී ස්වරූපයක් ගැනීම, පක්ෂය විසින් මැතිවරණ ව්‍යාපාරයේ දී ගොඩ නඟන ලද සංවිධාන ධනේශ්වර පක්ෂ විසින් ගොඩ නඟන ලද සංවිධාන වලින් වෙනස් නොවීම සහ ඒ හේතුවෙන් පක්ෂ කේඩරය අතිශයින් දුර්වල කොට දැමීම
- ප්‍රචාරක කටයුතු වල දෑවැන්ත බව සහ ප්‍රදර්ශණ වාදය විසින් සංවිධානයේ ගුණාත්මක ස්වභාවය විනාශ කර දැමීම, පක්ෂය සතුරන්ගේ අධිතක්සේරුවට ලක් වීම, පක්ෂ නායකත්වය පුද්ගල වන්දනාවට ලක් වෙමින් පිරිහී යෑම, නායකත්වය තුල කල්ලි වාදය කරලියට ඒම, නායකත්වයේ විප්ලවීය ජීව ගුණය පිරිහී යෑම සහ පක්ෂය තුල ප්‍රජාතන්ත්‍රවාදය නිසි අයුරින් ක්‍රියාත්මක කිරීමට ඉඩකඩ නොසැපයීම
- පක්ෂ නායකත්වයේ බුද්ධි හීනත්වය, පක්ෂ නායකත්වයට සුදුසු අන්දමේ සාමාජිකයන් හිඟ වීම සහ එවැනි නායකයන් ගොඩ නඟා ගැනීමට වැඩ පිළිවෙලක් නොමැති වීම, උසස් අධ්‍යාපන ආයතනවලින් පිට වී යන උගත් සහෝදර සහෝදරියන් පක්ෂය තුල ගොනු කර ගැනීමට පවා වැඩ පිළිවෙලක් නොමැති වීම
- පක්ෂය තුල සහ පක්ෂයෙන් පිටත උපදේශක මණ්ඩල ක්‍රියාත්මක කිරීමට වැඩ පිළිවෙලක් නොමැති වීම, සම්ප්‍රදායික සහ සෙසු වමේ පක්ෂ සමග උපක්‍රමික ආකාරයේ හෝ එක්සත් ක්‍රියා මාර්ග ගැනීම එක හෙලා ප්‍රතික්ෂෙප කිරීම, එවැනි උත්සාහයන් කඩා කප්පල් කර දැමීම සහ මර්දනකාරී තත්වයක් පක්ෂයට එල්ල වන විටදී පමණක් සම්ප්‍රදායික සහ සෙසු වමේ පක්ෂ සහ සංවිධානවල සහයෝගය පැතීම

එහෙත් ජනතා විමුක්ති පෙරමුණෙන් ඉල්ලා අස් වෙන්නට මට බල පෑ ආසන්න සහ ප්‍රබලතම හේතුව වූයේ මෙහි පහත විස්තර කරන කරුණු යි.

ජනාධිපති වරණය සහ ජනමත විචාරනය (කළගෙඩි වරණය) පැවැත්වූයේ 1982 දී ය. ඒ හා ආසන්න කාලයේ දී සහ ඉන් පසුව එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධව සිටි සහ අනෙක් ජාතික වාදී සහ ජාති වාදී කොටස් විසින් රට තුල ජාතිභේද වාදී ව්‍යාපාරයක් ගෙන යන ලදි. ජාතික ප්‍රශ්ණය සම්බන්ධයෙන් එතෙක් ජනතා විමුක්ති පෙරමුණ විසින් අනුගමණය කරන ලද ප්‍රතිපත්ති, වැඩ පිළිවෙල සහ ක්‍රියා මාර්ග මාක්ස් ලෙනින් වාදය විකෘති කොට ඉදිරිපත් කරමින් මෙම ජාතිභේද වාදී ව්‍යාපාරය හමුවේ පාවා දීම, රටේ පැවතුන විශේෂ සමාජ ඓතිහාසික තත්වයන් හේතුවෙන් ධනපති ක්‍රමයේ පැවැත්මේ මූලික කොන්දේසියක් ලෙස ජාතික ප්‍රශ්ණය කරලියට ගෙන ඇති බව නොපිළිගැනීම, ඒ අනුව ලාංකීය සමාජවාදී විප්ලවය සාර්ථක කර ගැනීම සඳහා ජනතා විමුක්ති පෙරමුණේ වැඩ පිළිවෙලට සහ ක්‍රියා මාර්ගවලට ජාතික ප්‍රශ්ණය බද්ධ කොට ගෙන කටයුතු කල හැක්කේ කෙසේද යන්න නොසලකා හැරීම, රජයේ මර්දනයට ලක් වේය යන හේතුව යොදා ගනිමින් දෙමළ ජන කොටස් නියෝජනය කළ ප්‍රගතිශීලී දේශපාලන ප්‍රවණතා සමග පවා සාකච්ඡා කිරීමට ප්‍රතික්ෂේප කිරීම, පක්ෂ නායකත්වයේ පැවති කල්ලි තුල ජනතා විමුක්ති පෙරමුණේ රජයක් තුල දෙමළ ජනයා සතු ඉරණම ගැන පක්ෂ ප්‍රතිපත්ති වලට ඉඳුරාම පටහැනි වූ ආකාරයේ කරුණු ‘විහිළු’ ආකාරයෙන් කතා බහට ලක් කිරීම සහ අවසාන වශයෙන් මාක්ස් ලෙනින් වාදය විකෘති කොට ව්‍යාජ ලෙස කරුණු ඉදිරිපත් කරමින් මෙම යුගයේ දී ජාතික ස්වයං නිර්ණයට ජනතාවට ඇති අයිතිය අවලංගු ප්‍රතිපත්තියක් ලෙස සලකා මුළුමනින් ප්‍රතික්ෂේප කර දැමීම යනාදිය මගේ ඉල්ලා අස් වීමට බල පෑ ආසන්න සහ ප්‍රබලතම කරුණු විය.

මෙම ලිපි පෙලේ අවසාන කොටස ලබන කලාපයෙන් ගෙන ඒමට බලා පොරොත්තු වෙමි.

ලයනල් බෝපගේ

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්
- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....
ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සදහන් අංකයනට අමතන්න
මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත
LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243